**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2015**

---

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංරජ) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මඟින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමඟින් ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,250 කට සමාන ජපන් යෙන් මිලියන 16,132 ක් වන අතර ඉන් රු.මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2018 ජූලි වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ

විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

### 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.මිලියන 2,637.66 ක් වටිනා කෙරීගෙන යන වැඩ තුළ එකතුව රු.මිලියන 1,113.15 ක් වූ විවිධ අත්තිකාරම් ශේෂ, වෙනත් ප්‍රදාන අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවලින් ලැබිය යුතු මුදල්වල ශුද්ධ ශේෂය සහ පූර්ව ගෙවීම් ආදී ශේෂයන් ඇතුළත් වී තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය තාත්විකව පිළියෙල කර නොතිබූ බවත්, ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වය මත මුදල් ගලාඒම් හා ගලායාම්, උපදේශකවරුන්ට ගෙවීම් ආදිය 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අදාළ සමුච්චිත ශේෂයන්ගේ වෙනස්වීම් සමඟ එකඟ නොවූ බවත් නිරීක්ෂණය විය.

**2.2.2 නොසැසඳූ ශේෂ**

2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් සපයන වෙනත් ව්‍යාපෘතිවලින් ලැබිය යුතු හා එම ව්‍යාපෘතිවලට ගෙවිය යුතු ශේෂයන් කාලීන අන්දමින් සසඳා නොතිබූ බව නිරීක්ෂණය විය. විගණනයේදී නිරීක්ෂණය වූ ශේෂවල වෙනස්වීම් පහත දැක්වේ.

| අරමුදල් සපයන වෙනත් ව්‍යාපෘතිවල නම | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | | වෙනස |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව | අරමුදල් සපයන වෙනත් ව්‍යාපෘති වාර්තා අනුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පාලම් 25 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 1.42 | 0.67 | 0.75 |
| සංවේදී ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය | 18.65 | 2.09 | 16.56 |
| දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 3.01 | නැත | 3.01 |
| මන්මුනෙයි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 5.64 | නැත | 5.64 |

### 2.2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ උපදෙස්වලට පටහැනිව පොදු කාර්ය ගාස්තු ලෙස රු.මිලියන 1.53 ක මුදලක් ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 12,381 | 20,914 | 3,000.00 | 1,754.77 | 2,098.71 | 1,944.70 | 2,325.86 |
| ශ්‍රී ලං ර | 3,751 | 6,336 | 55.12 | 45.97 | 54.98 | 90.67 | 108.44 |
| එකතුව | 16,132 | 27,250 | 3,055.12 | 1,800.74 | 2,153.69 | 2,035.37 | 2,434.30 |

ඉහත සඳහන් මූල්‍යයන වැඩපිළිවෙලට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගන්නා ලද රු.මිලියන 85 ක ණය මුදලක් ව්‍යාපෘතියට වෙන්කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ණය මුදල් උපයෝජනය හා ආපසු ගෙවීම් වැඩපිළිවෙල ආදිය පිළිබඳ විස්තර විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, ව්‍යාපෘතියේ පැකේජ - I යටතේ දකුණු පළාතේ ගාල්ල හා මාතර ප්‍රධාන පාලම් 10 ක ප්‍රතිසංස්කරණ වැඩ 2015 මාර්තු 20 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ පැකේජ - II යටතේ උතුරු පළාතේ වෙනත් ප්‍රධාන පාලම් 08 ක ප්‍රතිසංස්කරණ වැඩ සඳහා විස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම සමාලෝචිත වර්ෂය තුළදී නිමකර තිබූ නමුත් 2015 දෙසැම්බර් 31 වන විටත් එම පාලම්වල ප්‍රතිසංස්කරණ වැඩ ආරම්භ කර නොතිබුණි. තවද පැකේජ - III හා IV යටතේ වෙනත් ප්‍රධාන පාලම්වල ප්‍රතිසංස්කරණ වැඩ ආරම්භක සැලසුම් අදියරේ පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ඉහත සඳහන් පරිදි, ව්‍යාපෘතියේ පැකේජ- I යටතේ ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ප්‍රධාන පාලම් 10 ක ප්‍රතිසංස්කරණ වැඩ සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භකර තිබූ අතර ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 532.77 ක් වටිනා විචලන නියෝග 25 ක් ව්‍යාපෘතියේ පැකේජ - I යටතේ සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.3 ඡේදයෙහි අවශ්‍ය පරිදි වැඩ විෂය පථයේ විචලනයන් සඳහා වගකිය යුතු පාර්ශවයන්ගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එයින් රු.මිලියන 20.25 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර තිබුණි.

(ආ) මුල් සැලැස්මේ දැක්වෙන ප්‍රධාන පාලම් කිහිපයක ප්‍රතිසංස්කරණ වැඩ පසුව ව්‍යාපෘතිය විසින් ඉවත් කර තිබූ බවත්, මුල් සැලැස්මේ ඇතුළත් නොවූ වෙනත් පාලම්වල වැඩ ඇතුළත් කර තිබූ බවත් නිරීක්ෂණය විය. එබැවින් ගාල්ල දිස්ත්‍රික්කයේ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම යටතේ මුල් සැලැස්මේ ඇතුළත් වූ හල්පාතොට පාලම ප්‍රතිසංස්කරණය කිරීම ඉවත්කර තිබූ අතර මුල් සැලැස්මේ ඇතුළත් නොවූ මාතර දිස්ත්‍රික්කයේ වැල්ල මඩම පාලම ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් කර තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ කීඹි ඇල පාලම සඳහා පයිල් අත්තිවාරම පිළිබඳ සැලසුම් වෙනස්කර තිබූ අතර ආරම්භක අදියරේදී දෝෂ සහිතව සිදුකරන ලද පොළවේ සමීක්ෂණ හේතුවෙන් ඒ සඳහා රු.මිලියන 22.35 ක අතිරේක පිරිවැයක් වැය කර තිබුණි.

## 3.4 ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

---

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ව්‍යාපෘතියේ පැකේජ- I යටතේ ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය 2015 මාර්තු 20 දිනට පෙර නිම කළ යුතු විය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පිහිටි ඉඩම් කැබලි 242 ක් අත්පත් කර ගැනීමට ව්‍යාපෘතිය විසින් ඉලක්ක කර තිබූ බවත් ඉන් ඉඩම් කැබලි 233 ක් අත්පත් කරගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. ඉඩම් කැබලි 137 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.09 ක වන්දි ගෙවා තිබුණි. තවද ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ කිසිදු ඉඩම් කැබැල්ලක අයිතිය අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරා නොතිබුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

---

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ණය මුදලේ වියපැහැදම් නොකළ ශේෂය සඳහා ණය සපයන නියෝජිතායතනය විසින් රු.මිලියන 13.39 ක බැඳීම් ගාස්තු අයකර ගෙන තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යය මණ්ඩලය 62 ක් අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 31 දෙනෙකුගෙන් සමන්විත විය. සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ඉංජිනේරු තනතුරු 02 ක්, ව්‍යාපෘති ඉංජිනේරු තනතුරු 07 ක්, තාක්ෂණ නිලධාරී තනතුරු 09 ක් ඇතුළත් තනතුරු පුරප්පාඩු 41 ක් පිරවීමෙන් තොරව පැවතුණි. තවද උපදේශකවරුන් 04 දෙනෙකු මහජන සම්බන්ධීකරණ නිලධාරීන් තිදෙනෙකු, සැහැල්ලු උපකරණ මෙහෙයුම්කරුවන් තිදෙනෙකු ඇතුළත් සේවකයින් 15 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද එම තනතුරු සඳහා යොදවා තිබුණි.